**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
# University of Sri Jayewardenepura

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
## External Degrees and Extension Courses Unit

---

# බාහිර උපාධි සම්මන්ත්‍රණ සඳහා සහභාගි වන සිසුන් වෙත කෙරෙන විශේෂ නිවේදනයයි

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් මෙහෙයවන සියලුම බාහිර උපාධි පාඨමාලාවලට අදාළව එක් විෂයක් සඳහා පැය හතළිහක ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පවත්වනු ලැබේ.

ඒ සඳහා සම්පත් දායකයින් වශයෙන් සහභාගි වන්නේ අදාළ විෂය පිළිබඳ ප්‍රාමාණික දැනුමකින් යුත් ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් ය. ප්‍රශ්න පත්‍ර සැකසීම හා පිළිතුරුපත් පරීක්ෂා කිරීම ඔවුන් විසින්ම සිදු කරනු ලැබේ. එබැවින් මෙය බාහිර උපාධි පාඨමාලා හදාරන උපාධි අපේක්ෂකයින්ට මහඟු අවස්ථාවකි. මෙකී සම්මන්ත්‍රණ තුළින් උපරිම ප්‍රයෝජන ලබා උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම පිණිස ඔබ විසින් පහත සඳහන් ආචාරධර්ම පිළිපැදිය යුතු බව මෙහිලා අවධාරණය කරමි.

1. සජීවී ලෙස පවත්වන මාර්ගගත දේශන (Online Lectures) සඳහා සක්‍රීය ලෙස සම්බන්ධ වී සිටීම. (අඛණ්ඩව අවස්ථා තුනක් මාර්ගගත දේශන සඳහා සහභාගි නොවන අපේක්ෂකයන්ගේ LMS Login අක්‍රීය වීමට ඉඩ ඇත).
2. නියමිත වේලාවට දේශනවලට සම්බන්ධ වී එය අවසන් වන තෙක් රැඳී සිටීම.
3. දේශන හා සම්බන්ධ වීමේදී ඔබගේ ශිෂ්‍ය අංකය නමින් පමණක් Zoom Account Rename කිරීම.
4. Video on කර දේශනයට සම්බන්ධ වන්නේ නම් නිසි ඇඳුමකින් සැරසී සිටීම.
5. දේශකයා සමඟ සාකච්ඡා කරන අවස්ථාවක හැර සෑම විටම මයික්‍රෆෝනය අක්‍රිය කර තැබීම.
6. අනවශ්‍ය ශබ්ද හා බාධා කිරීම්වලින් තොරව සම්මන්ත්‍රණය ආරම්භයේ සිට අවසානය දක්වාම කිසිදු බාධාවකින් තොරව දේශන පවත්වාගෙන යාමට සහය දැක්වීම.

ඉහත මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කරමින් නිසි කලට උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ගැනීමට ක්‍රියා කරන ලෙස දන්වා සිටිමි.

අධ්‍යක්ෂ
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය